# ලංකා බැංකු සේවක සංගමය
# இலங்கை வங்கி ஊழியர் சங்கம்
# CEYLON BANK EMPLOYEES' UNION

ලියාපදිංචි අංකය
பதிவு இல :1151
**Registered No**

අංක 20, පන්සල පාර, කොළඹ 10. இல. 20, பன்சல வீதி, கொழும்பு 10, No. 20, Temple Road, Colombo 10
දුරකථන /தொலைபேசி/ Telephone:011-2693811/011-2674840, ෆැක්ස් /தொலைநகல்/ Fax: 011-2674840
E.Mail : cbeu@sltnet.lk, cbeu1@sltnet.lk, Web - www.cbeu.lk


(අභ්‍යන්තර විවරණිකාව - සාමාජිකයින් අතරේ පමණයි)

ප්‍රිය සහෝදරය/සහෝදරිය

පී.යු.2019/21

## සේවක ණය පොලී හා සුභසාධන ප්‍රතිලාභ මත බදු අයකිරීමට එරෙහිව

## රාජ්‍ය බැංකුවල පවතින විශ්‍රාම ක්‍රමයන්හි ගැටලු නිවැරදි කිරීම සහ විශ්‍රාම අභිමි බැංකු සේවකයාට සිය සැඳෑ සමයේ ජීවත්වීමට සරිලන විශ්‍රාම යෝජනා ක්‍රමයක් ස්ථාපිත කරගනු පිණිස

# ලංකා බැංකු සේවක සංගමය දිවයින පුරා ඇරඹූ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග අතිසාර්ථකයි

**මුදල් අමාත්‍යංශය නින්දෙන් අවදි වේ. 2019 ජුනි 20 දින සංගමයට සාකච්ඡාවක් ලබා දෙයි පවතින තත්වය පිළිබඳව ජනපති, අගමැති, විපක්ෂ නායක දැනුම්වත් කිරීමට සංගමය කටයුතු කරයි. විපක්ෂ නායකගෙන් කඩිනම් සාකච්ඡාවක්. 2019 ජුනි 26 දින සංගමය සමග පැවති සාකච්ඡාවෙන් අනතුරුව විපක්ෂ නායකවරයා විශේෂ මාධ්‍ය නිවේදනයක් නිකුත් කරයි.**

ඔබගේ සාමාජික ශක්තිය නිවැරදිව උරගා බලමින් බැංකු සේවකයාට බලපාන සකලවිධ මර උගුල්වලට එරෙහිව, ලංකා බැංකු සේවක සංගමය වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට එළඹීමට අදහස් කරන ලද්දේ සාකච්ඡා මාර්ගයෙන් ප්‍රශ්න විසඳා ගැනීමට අසමත් වත්මන් ආණ්ඩුවට සහ අමාත්‍යංශ බලධාරීන් ඇතුළු පාලකයින්ට අරගලයෙන් නිසි පිළිතුරු ලබාදීමටය. එසේම එම වෘත්තීය සමිති ක්‍රියාමාර්ග අදියර 2 ක් ඔස්සේ ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද්දේ තවදුරටත් ප්‍රශ්න නිරාකරණය කර ගනිමින් බැංකු ක්ෂේත්‍රයේ කාර්මික සාමය රැකගැනීමට සියලු පාර්ශවයන් වෙත සාධාරණ අවස්ථාවක් ලබාදීම පිණිසය. මුල් අදියරේ දී දියත් කෙරුණු ක්‍රියාමාර්ගයන් ලෙස සාමාජිකත්වය සහ මහජනතාව දැනුම්වත් කිරීමේ කටයුතු ආරම්භ කෙරුණු අතර **2019 ජුනි 18** වැනි දින කොළඹ ඇතුළත පෝස්ටර් ව්‍යාපාරයක් සාර්ථකව ක්‍රියාවට නැංවිණි. **2019 ජුනි 25** දිනෙන් ආරම්භ කළ විරෝධතා ලාංඡන පැළඳ නිහඬ විරෝධතාවක් දැක්වීම මේ වනවිටත් අතිසාර්ථක ලෙස දිවයින පුරා බැංකු ශාඛාවල ක්‍රියාත්මක වේ.

සංගමය කළ ආරාධනයට අනුගත වෙමින් බැංකු ක්ෂේත්‍රයේ පොදු යහපත පිණිස සංගම් භේදයකින් තොරව, නිලධාරී භේදයකින් තොරව සියලුම බැංකු සේවකයින් එම විරෝධතා ලාංඡන පැළඳ ගනිමින් සිය ක්ෂේත්‍රයේ අභිමානවත් ශක්තිය ලොවටම ප්‍රදර්ශනය කරද්දී සුපුරුදු හොරිකඩ කම් කරමින් ලැබෙන දේට පමණක් දත නියවන, තමන් සතු යුතුකම් අමතක කළ සුළු පිරිසක් ද සිටි බව සංගමයට වාර්තා විය. ඔවුන්ට තමන් විසින්

තමාටම සිදුකර ගන්නා වරදේ බරපතලකම නුදුරු අනාගතයේදීම අවබෝධ වන බැවින් බැංකු සේවකයින් ලෙස ඔවුන්ගේ ද යහපත පතා පොදුවේ කටයුතු කරන ලෙසට අපගේ අභිමානවත් බැංකු සේවක සහෘදයන්ගෙන් ඉල්ලා සිටිමු.

## ඇරඹුම සුභ නිමිති මැදින්

වත්මන් ආණ්ඩුව, බැංකු සේවකයාගේ නිවාස ණය සහන පොලී ඇතුළු සුභසාධන ප්‍රතිලාභවලට බදු අයකරමින් බැංකු සේවකයාට හිමි විශ්‍රාම ප්‍රතිලාභ කප්පාදු කරමින් සේවකයාගේ ආරක්ෂාව වෙනුවෙන් පවතින කම්කරු අණපනත් පාලකයින්ගේ උවමනාවන්ට අනුව සංශෝධනය කරමින් සිදුකරගෙන යන සකලවිධ ක්‍රියාමාර්ගයන්ට එරෙහිව රටේ බැංකු සේවකයින්ගේ ප්‍රතිචාරය, පැවති විරෝධතා මගින් මනාවට ප්‍රදර්ශනය විය. එසේම මෙම විරෝධතාවයේ දී 1996 න් පසුව ලංකා බැංකුවට, මහජන බැංකුවට සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවට බැඳුනු සේවකයින් වෙත ස්ථාපිතකර ඇති විශ්‍රාම යෝජනා ක්‍රමයන්හි පවතින ගැටලු නිවැරදිකර ගැනීමට සහ කිසිදු විශ්‍රාම ක්‍රමයක් නොමැති රාජ්‍ය සහ පෞද්ගලික බැංකුවලට විශ්‍රාම යෝජනා ක්‍රමයක් ස්ථාපිතකර ගැනීමට ඇති අවශ්‍යතාව ද පිළිඹිබු විය. විරෝධතා ලාංඡන පැළඳ රාජකාරී කටයුතු සිදුකිරීමේ අරමුණ ගනුදෙනුකරුවන්ට සහ මහජනතාව වෙත සන්නිවේදනය කිරීම සඳහා අත්පත්‍රිකා බෙදා හැරීමක් ද සිදුවිය. ඊට සමගාමීව **2019 ජුනි 27 දින** උදෑසන කොළඹ ආශ්‍රිත සියලුම දුම්රිය ස්ථාන කේන්ද්‍රකර ගනිමින් මහජන අත්පත්‍රිකා බෙදාහැරීමේ වැඩ සටහනක් ද සාර්ථකව ක්‍රියාවට නගන ලදී.

මෙම සියලු අරගල හමුවේ, නිදා සිටි පාලකයින් නින්දෙන් අවදිව සාකච්ඡා ලබාදීමට සහ පවතින ගැටලු විසඳීම සම්බන්ධයෙන් කමිටු පත් කිරීමට දැනටමත් පියවර ගෙන ඇති බව සාමාජිකත්වය වෙත වාර්තාකර සිටිමු. එහෙත් අතීතයේ දී ආණ්ඩු විසින් ලබාදෙන ලද සිහින මාලිගා පොරොන්දු පිළිබඳව හොඳින් දන්නා අපි පිළිගත හැකි විසඳුමක් ලබාදෙන තෙක් දැනට ක්‍රියාත්මකවන වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයන් අතරමග නතර නොකරන බවට සියලු සාමාජිකත්වය වෙත සපථකර සිටිමු. ගැටලු විසඳීම පසෙකලා නාමමාත්‍ර කමිටු පත්කිරීමෙන් කිසිදු යහපත් ප්‍රතිඵලයක් නොලැබෙන බව පාලකයින් අවබෝධකරගත යුතුව ඇත.

රටේ බැංකු පද්ධතියේ පවතින වර්තමාන ගැටලු සහගත තත්වය පිළිබඳව සංගමය විසින් ජනාධිපති, අගමැති, විපක්ෂ නායක ඇතුළු වගකිවයුතු අංශ දැනුම්වත් කරන ලදී. එහිදී විපක්ෂ නායකවරයා, සංගමයට කඩිනම් සාකච්ඡාවක් ලබාදුන් අතර **2019 ජුනි 26 දින** එම සාකච්ඡාව විපක්ෂ නායක කාර්යාලයේ දී පැවැත්විණි. සංගමය ඉදිරිපත් කළ කරුණු පිළිබඳව සලකා බැලූ එතුමා ලාංකීය බැංකු ක්ෂෙත්‍රයට බලපාන පොදු කරුණු සම්බන්ධයෙන්, විශේෂයෙන්ම රාජ්‍ය බැංකු පෞද්ගලීකකරණයට එරෙහිව මාධ්‍ය සාකච්ඡාවක් පවත්වා සිය ස්ථාවරය රටටම හෙළිදරව් කළේය. මෙම තත්වය යහපත් ප්‍රවණතාවක් ලෙස අපි දකිමු. **ලංකා බැංකු සේවක සංගමයට කිසිදු දේශපාලන පක්ෂයක් හෝ පුද්ගලයෙක් දේශපාලනික වශයෙන් ඇගයීමට හෝ විවේචනය කිරීමට කිසිදු අවශ්‍යතාවක් නොමැත. එහෙත් යම් දේශපාලන ප්‍රවාහයක් රටේ යහපත පිණිස ඉදිරිපත්වන්නේ නම් එය අගැයීමට ද, රටට අවැඩදායක ලෙස අයහපත් අයුරින් ක්‍රියාත්මක වන්නේ නම් ඊට එරෙහිව කොන්දේසි විරහිතව අරගල කිරීමට ද සංගමය සූදානම් බව සමස්ත සාමාජිකත්වය වෙත සපථකර සිටිමු**.

සංගමය විසින් සිදුකරනු ලබන මෙම වෘත්තීය සමිති ක්‍රියාමාර්ග බැංකු සේවකයාගේ යහපත පිණිස ආරම්භ කරන ලද ඒවා වන අතර ජනප්‍රිය දේශපාලන තීන්දු මෙන් නොව, එම තීරණ ගෙන ඇත්තේ සේවකයාගේ මෙන්ම ආයතනයේ ද අනාගත යහපැවැත්ම තහවුරු කරනු පිණිස මාස ගණනක ඉවසීමෙන් පසු බව වගකීමෙන් ප්‍රකාශකර සිටිමු. එබැවින් තවදුරටත් බැංකු සේවකයා මුලා නොකර පිළිගත හැකි විසඳුම් ලබාදීම පාලකයින්ගේ මෙන්ම එම ආයතනවල ප්‍රධානීන්ගේ ද ප්‍රධාන වගකීමක් වේ.

වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවල පළමු අදියර යටතේ **2019 ජුලි 02 වන දින** දිවයින පුරා පෝස්ටර් ව්‍යාපාරයක් දියත් කිරීමට නියමිත අතර **2019 ජුලි 03 වන දින** ප්‍රධාන නගර 24 කදී කෑම පැයේ දී (ප ව 12.30-01.30 දක්වා) පිකට් උද්ඝෝෂණ පැවැත්වීමට නියමිතය. මෙම උද්ඝෝෂණ සම්බන්ධයෙන් සියලු විස්තර ශාඛා සංගම් නිලධාරී මණ්ඩලය වෙත සහ සියලු දිස්ත්‍රික් සංවිධාන වෙත දන්වා යවා අවසන් හෙයින් එම උපදෙස් නිවැරදිව පිළිපදිමින් මෙම අරගලයට තම තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් උපරිමව දායකවන ලෙස ඉල්ලා සිටිමු.

ප්‍රධාන නගරවල පැවැත්වීමට නියමිත උද්ඝෝෂණ මාලාවෙන් අනතුරුව **2019 ජූලි මස 08-12 දින වල දී** කොළඹ නගරයේ බැංකු ශාඛාවල ප්‍රධාන කාර්යාල කේන්ද්‍රකර ගනිමින් පිකට් උද්ඝෝෂණ 05 ක් සංවිධානයකර ඇත. එම උද්ඝෝෂණ මාලාවට සහාය දක්වමින් **2019 ජූලි 10 දින** තෝරාගත් උප නගරවල පිකට් උද්ඝෝෂණ සංවිධානය කෙරෙන අතර එලෙස සංවිධානය කෙරෙන උද්ඝෝෂණ පැවැත්විය යුතු නගරය, ස්ථානය සහ වේලාවන් දිස්ත්‍රික් සංවිධාන නියෝජිතයින් මාර්ගයෙන් මහා සාමාජිකත්වය වෙත සන්නිවේදනය කෙරෙනු ඇත. සංගමයේ සියලු දිස්ත්‍රික් නායකයින්ගේ සංවිධාන ශක්තිය සහ සහයෝගය උප නගරවල පැවැත්වීමට නියමිත උද්ඝෝෂණ සාර්ථකකර ගැනීම සඳහා ඉතා අත්‍යවශ්‍ය වනු ඇත. ඒ සම්බන්ධ සියලු උපදෙස් ශාඛා සංගම් මාර්ගයෙන් සහ සෘජුවම දිස්ත්‍රික් නායකත්වය වෙත ලබාදී ඇති අතර කිසියම් අමතර දැනුම්වත්වීමක් අවශ්‍ය වන්නේ නම් ලංකා බැංකු සේවක සංගම් කාර්යාලය ඇමතීමට (0112693801 සහ 0112693811) කටයුතු කරන ලෙස සහෝදරත්වයෙන් දැනුම් දී සිටිමු.

ඉදිරියේ දි දියත් කිරීමට නියමිත මෙම වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට ලංකා බැංකු සේවක සංගමයේ සාමාජිකයින් පමණක් නොව රටේ අනෙකුත් සියලුම පෞද්ගලික බැංකු සහ මූල්‍ය ආයතනවල සේවක ප්‍රජාව ද එක්වීමට සිය කැමැත්ත පළකර ඇත. **වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවල දෙවන අදියර ක්‍රියාත්මක වීමට පෙර** බැංකු ක්ෂේත්‍රයට බලපාන මෙම ගැටලුවලට තිරසාර විසඳුමක් ලබාදීමට පාලකයින් සහ බලධාරීන් අපොහොසත් වන්නේ නම් අඛණ්ඩ වැඩ වර්ජනයක් දක්වා වූ දැඩි ක්‍රියාමාර්ගවලට එළැඹීමට ලංකා බැංකු සේවක සංගමයට සිදුවනු ඇත. එවැනි වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලින් ගනුදෙනුකරුවන්ට සිදුවන සකලවිධ අපහසුතාවලට වගකිව යුත්තේ ගැටලු නිරාකරණය කිරීමට නොදත් එම පාලකයින් සහ බලධාරීන්ම පමණක් බව අවධාරණය කර සිටිමු.

එළඹෙන වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවල ඉදිරි තත්වයන් හා වැඩ පිළිවෙළ පිළිබඳ උපදෙස් ශාඛා සංගම් හා සටන් කමිටු නියෝජිතයින් මාර්ගයෙන් සාමාජිකත්වය වෙත අදියරෙන් අදියරට ලබාදීමට නියමිත බැවින් එම උපදෙස් පිළිපදිමින් බැංකු සේවකයා සතු යුතුකම ඉටු කිරීමට ලංකා බැංකු සේවක සංගමයේ අභිමානවත් ධජය වටා රොක්වන ලෙස සියලුම බැංකු සේවක ප්‍රජාවගෙන් සහෝදරත්වයෙන් යුතුව ඉල්ලා සිටිමු.

**බැංකු ක්ෂේත්‍රයේ පොදු යහපත පිණිස එක්ව සටන් වදිමු!**
**විසඳුම් ලැබෙන තුරු අරගලය අත් නොහරිමු!**

**ලංකා බැංකු සේවක සංගමය දිගුකල් දිනේවා!**

මෙයට - සහෝදරත්වයෙන්

***චන්න දිසානායක***
සභාපති

2019 ජුනි 28 වැනි දින

***රන්ජන් සේනානායක***
ප්‍රධාන ලේකම්

## සංගමයේ වෙබ් අඩවිය - www.cbeu.lk

**මේ වනවිට සංගමයේ වෙබ් අඩවිය ක්‍රියාත්මක වෙමින් පවතී. එබැවින් සංගමය පිළිබඳ තොරතුරු, සාමාජිකත්ව ඉල්ලුම්පත්, ශිෂ්‍යත්ව, මරණාධාර, මාතෘාධාරක වැනි ඉල්ලුම්පත් ආදිය සඳහා www.cbeu.lk වෙබ් අඩවියට පිවිසෙන ලෙස සහෝදරත්වයෙන් දන්වා සිටිමු.**

# උද්ඝෝෂණ උපදෙස් මාලාව

| 2019 ජූලි 03 බදාදා | ප ව 12.30 සිට ප ව 01.30 (දහවල් කෑම පැයේ දී) |
|---|---|

| දිස්ත්‍රික්කය | පිකට් උද්ඝෝෂණය සිදුකළ යුතු නගරය | දිස්ත්‍රික්කය | පිකට් උද්ඝෝෂණය සිදුකළ යුතු නගරය |
|---|---|---|---|
| අම්පාර | අම්පාර | කෑගල්ල | කෑගල්ල |
| අනුරාධපුර | අනුරාධපුර | කුරුණෑගල | කුරුණෑගල |
| බදුල්ල | බදුල්ල | මාතලේ | මාතලේ |
| මඩකලපුව | මඩකලපුව | මාතර | මාතර |
| ගාල්ල | ගාල්ල | මොණරාගල | මොණරාගල |
| ගම්පහ | ගම්පහ | නුවරඑළිය | නුවරඑළිය |
| හම්බන්තොට | හම්බන්තොට | පොළොන්නරුව | කදුරුවෙල |
| යාපනය | යාපනය | හලාවත/පුත්තලම | හලාවත |
| කලුතර | කලුතර | රත්නපුර | රත්නපුර |
| මහනුවර | මහනුවර | ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය |
| | | වන්නි | වවුනියාව |

01 දිස්ත්‍රික් නායකයින් වෙත එවා ඇති සටන්පාඨ පුවරු පිකට් උද්ඝෝෂණයේ දී භාවිත කරන්න. (වෙනත් සටන්පාඨ ඇතුළත් පුවරු භාවිත නොකළ යුතුයි.)

02 ඔවුන් වෙත එවා ඇති පත්‍රිකා උද්ඝෝෂණය අතරතුර ජනතාව අතරේ බෙදා හරින්න

03 එවා ඇති සටන්පාඨ කවි උද්ඝෝෂණයේ දී භාවිත කරන්න

04 උද්ඝෝෂණය සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් (මෙගා ෆෝන්, වතුර බෝතල් ආදිය) දිස්ත්‍රික් සංවිධානය වෙතින් සපයා ගන්න - අවශ්‍ය වේනම්)

05 දිස්ත්‍රික් සංවිධානයේ සියලු බැංකු ශාඛා මේ සඳහා සහභාගී කරවා ගන්න

06 උද්ඝෝෂණය සඳහා නගරයේ වඩාත්ම ජනාකීර්ණ ස්ථානය ප්‍රචාරක වාසිය උදෙසා තෝරා ගන්න